**ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මූල්‍ය නොවන වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් පිරිවැය රු.6,717,017ක් හා රු.1,380,261 ක් වූ යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණද එම වත්කම් හඳුනාගෙන අදාල මූල්‍ය නොවන වත්කම් ගිණුම්වලින් ඉවත්කර නොතිබීමෙන් එම වටිනාකමින් මූල්‍ය නොවන වත්කම් ශේෂය වැඩියෙන් දැක්විණි. එසේම ඉකුත් වර්ෂයට පෙරද මෙසේ යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණද එම වටිනාකම්ද මූල්‍ය නොවන වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | අපහරණය කරන ලද වත්කම්වල කේතාංක හා වටිනාකම CIGAS දත්ත පද්ධතියේ කේතාංක හා වටිනාකම් සමඟ නොගැලපෙන බැවින් අපහරණය කරන ලද වත්කම්වල පිරිවැය මූල්‍ය නොවන ගිණුම්වලින් ඉවත් කර නොමැත. කඩිනමින් යාවත්කාලීන කර විගණනය වෙත දැනුම්දීමට කටයුතු කරමි. | යන්ත්‍ර හා උපකරණ අපහරණය කළ වත්කම් හඳුනාගෙන අදාල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ශේෂයෙන් ඉවත් කර නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 02 ක් සඳහා පිළිවෙලින් රු.50,000,000 සහ රු.5,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය | ජාතික අයවැය චක්‍රලේඛ 02/2023 ට අනුව අත්‍යාවශ්‍ය යන්ත්‍ර හා උපකරණ වැඩිදියුණු කිරීම් පමණක් සිදු කිරීම නිසා මෙම ඉතුරුවීම් ඇති වී ඇත.<br>යාපනය දිස්ත්‍රික් මැතිවරණ | 2023 වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී 03/2022 චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කර මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

| | |
|---|---|
| පිළිවෙලින් රු.38,740,095 ක් සහ රු.1,144,485 ක් වශයෙන් සියයට 77ක් හා සියයට 23 ක්විය. | කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ පළමු අදියරේ වැඩ අවසන් කිරීමට පෙර කාර්යාලය විවෘත කර දෙවන අදියර ආරම්භ කිරීමට නියමිත වුවත් විවෘත කිරීම ප්‍රමාද වූ බැවින් හා දෙවන අදියරේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාපත් කර ගැනීම ප්‍රමාදවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය යුතු වුවත් කොමිෂන් සභාව ඊට පටහැනිව වැය විෂයයන් 4 ක් සඳහා රු.9,282,806ක බැරකම් වලට එළඹ තිබූ අතර ඒ හේතුවෙන් එම වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවූ බැරකම් රු.8,770,087ක් වී තිබුණි. | මු.රෙ. 94(2) හා 94(3) ට අනුකූලව කාර්යාලීය කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා ඉහත බැරකම්වලට එළඹීමට සිදුවිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| (i) | 2016 දෙසැම්බර් 06 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාවේ වාහන 47 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මේ වනවිට ප්‍රධාන කාර්යාලයේ වාහන 4 ක සහ දිස්ත්‍රික් කාර්යාල 12 ක ඉන්ධන දහන පරීක්ෂා සිදුකර ඇති අතර, ඉතිරි වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු මේ දිනවල සිදුකරගෙන යනු ලබන බව ද දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2008 ජුනි 28 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය සහ 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02(ඇ)(iv) ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව වෙන් කල වාහන වලට හිමි ඉන්ධන සීමාව ඉක්මවා 2023 වර්ෂයේ වෙන් කළ වාහන 03 ක් සඳහා ඉන්ධන ලීටර් 1238.5 ක් ලබාදී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මෙම වාහන කොමිෂන් සභාවේ සභාපතිවරයා, මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා වෙත වෙන්කළ වාහන වේ. සභාපතිවරයා සහ කොමසාරිස් ජනරාල්වරයා ආයතන ප්‍රධානීන් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් දිවයින පුරා ආරාධනා ලැබීම්, දේශන, වැඩමුළු වැනි අත්‍යාවශ්‍යයෙන්ම සහභාගී වියයුතු අවස්ථාවන් සඳහා හා 2023 ජනවාරි මාසයේ දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කර තිබූ බැවින් එම කාර්යයන් සඳහාද අමතර ඉන්ධන ලබා දී ඇත. එසේම ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත වෙන්කර ඇති වාහනය, විගණන කටයුතු සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත එම අංශයේ නිලධාරීන් ද සමඟ ධාවනය කරවන අවස්ථාවල දී අමතර ඉන්ධන ලබා දී ඇත. එම අවස්ථාවන්හිදී නිලධාරීන් කිහිපදෙනෙකු ගමන් කරන බැවින් එය ද කණ්ඩායම් ප්‍රවාහනය සේ සලකා කටයුතු කර ඇති බැව් දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ඩිජිටල් කොපි ප්‍රින්ටර් (DCP) යන්ත්‍ර 2 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය** | | |
| (i) 2023 වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඩිජිටල් කොපි ප්‍රින්ටර් (DCP) යන්ත්‍ර 2ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2023ජුනි 30 දින වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණද යන්ත්‍ර මිලදී ගැනීමේ කටයුතු අවසන්ව තිබුණේ 2023 නොවැම්බර් 21 දිනදීය. | මෙම මිලදී ගැනීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වූයේ පළමු ලංසු කැඳවීමේ දී මිලදී ගැනීම් කටයුතු සිදු නොකර නැවත මිල කැඳවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ක්‍රියා කළ බැවින් බව සඳහන් කරමි. | අනුමත ප්‍රසම්පාදන සැලැස්මෙහි කාල සීමාවන් අනුව කටයුතු කළ යුතු වීම. |
| (ii) ඩිජිටල් කොපි ප්‍රින්ටර් (DCP) යන්ත්‍ර 2 මිලදී ගැනීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ 2023 මැයි 16 දින ලියාපදිංචි සැපයුම්කරුවන් 8 ගෙන් මිල ගණන් කැඳවා තිබුණු අතර සැපයුම්කරුවන් 4 ගෙන් මිල ගණන් ලැබී තිබුණි. ප්‍රසම්පාදනය සැලසුම්කරන අවස්ථාවේදී යන්ත්‍රයේ පිරිවිතර නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් නැවත පෙර සැපයුම්කරුවන්ගෙන්ම මිල ගණන් කැඳවා තිබුණි. සැපයුම්කාර ආයතනය පළමු මිලගණන් කැඳවීමේදී අවම මිල රු.805,000ක් ලෙස හා දෙවන මිල ගණන් කැඳවීමේදී අවම මිල රු.1,035,000 ක් ලෙස ඉදිරිපත් කිරීම නිසා මෙම ප්‍රසම්පාදනයේදී නිසි පරිදි යන්ත්‍රයේ පිරිවිතර හඳුනා නොගැනීමෙන් රු.230,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | ලැබී තිබූ මිළ ගණන් ඇගයීමේ දී F4 කඩදාසි ප්‍රමාණය දක්වා පමණක් මුද්‍රණය කල හැකි යන්ත්‍රයක් සඳහා මිල ගණන් ලැබී තිබූ බැවින් හා එම මිල ගණන් ඉදිරිපත් වී ඇති අනෙක් මිළ ගණන් 3ට සාපේක්ෂව 1/3 කටත් වඩා අඩු අගයක් ගන්නා බව පෙනී ගිය බැවින් එම අවශ්‍යතාවය දක්වා පමණක් මුද්‍රණය කිරීමට සෑහේ නම් ඒ යටතේ නැවත මිල කැඳවා මිලදී ගැනීමට කටයුතු කිරීම තුළින් විශාල මූල්‍යමය වාසියක් ලැබෙන බැවින් එසේ නිර්දේශ ලබා දී ඇත. ඒ අනුව දෙවන මිල කැඳවීමේ දී යන්ත්‍රයක මිල රු.100,000/- කින් (VAT රහිත) ඉහළ අගයක් ගෙන ඇත. එහෙත් එම අවස්ථාවේ ඉදිරිපත් වී තිබූ අවම මිල එය වේ. ඒ අනුව යන්ත්‍ර 2ක සඳහා පළමු ලංසු කැඳවීමේ මිලට වඩා VATසහිතව රු. 230,000/-ක මුදලක් ගෙවීමට සිදුව ඇත. | ප්‍රසම්පාදනය සැලසුම්කරණ අවස්ථාවේදී යන්ත්‍රයේ පිරිවිතර නිවැරදිව හඳුනාගත යුතු වීම.<br>.. |

**(ආ) ප්‍රධාන කාර්යාලයට අමතර විදුලි ජනන යන්ත්‍රයක් සහ ඉන්ධන ටැංකියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය**

| | | |
|---|---|---|
| (i) 2022 වර්ෂයේදී ගිවිසුම්වලට එළඹී විදුලි ජනන යන්ත්‍රය මිලදීගැනීමට හා ගෙනවිත් සවිකිරීම සඳහා අදාල සැපයුම්කරු විසින් රු.6,289,650ක බදු රහිත මිලක් ඉදිරිපත් කර තිබුණි. එම වටිනාකම තුල ඉන්ධන ටැංකිය (Bulk Storage Fuel Tank) හා එය සවිකිරීම සඳහා වන රු.734,500ක වියදමද ඇතුළත්ව තිබුණි. 2023 ජනවාරි 14 දිනවිදුලි ජනන යන්ත්‍රය සවිකිරීමේදීඉන්ධන ටැංකිය සවි කර නොතිබු හෙයින් ප්‍රසම්පාදනයේ බදු රහිත මිල රු.5,555,150 ක් විය. එහෙත් යන්ත්‍රය සවිකරන ස්ථානය පසුව වෙනස් කිරීම හේතුවෙන් අදාල සැපයුම්කරුවෙත 2023 අප්‍රේල් 17 දින අවසන් බිල්පත ගෙවීමේදී රු.6,010,800 ක් බදු රහිතව ගෙවා තිබීමෙන් රු.455,650 ක් කොමිෂන් සභාවට වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | අදාල මිල ගණන් හා පිරිවිතර පරීක්ෂාවෙන් අනතුරුව ඇගයීම් කමිටුව ලබාදී ඇති නිර්දේශ මත බදු රහිත මුදල වන රු.6,289,650.00 යටතේ එම ආයතනයෙන් කාර්යය ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඒ අනුව ඇනවුම් ලබාදී ඇත2022 දෙසැම්බර් මස විදුලි ජනක යන්ත්රය සපයා සවිකර අවසන් කර ඉන්වොයිසි ඉදිරිපත් කළ පසු ඒ වන විට පැවති ප්‍රතිපාදන ඉතිරිවීම් මත 2022 දෙසැම්බර් මස දී රු. 4,767,000.00ක චෙක්පතක් ලියා තබාගත් අතර එය අදාළ ආයතනය වෙත නිකුත් කරනු ලැබුයේ 2023.01.17 දින දීය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු විම |
| (ii) අමතර ඉන්ධන ටැංකියක් ස්ථාපිත කිරීමට අදාල ඉන්වොයිසිය සැපයුම්කාර ආයතනය විසින් 2022 දෙසැම්බර් 20 වන දින නැවත ඉදිරිපත් කර තිබුණද, එම ටැංකිය ස්ථාපිත කර තිබුණේ 2023 අගෝස්තු 15 දින එනම් මාස 08 ක ප්‍රමාදයක්ද සමගිනි. | අමතර ඉන්ධන ටැංකිය සඳහා වන ඉන්වොයිසිය ඉදිරිපත් කර තිබුන ද ඉන්ධන ටැංකිය සවිකර අවසන් වනතුරු ගෙවීම් සිදුකර නැත. ඒ සඳහා ගෙවීම් සිදුකර ඇත්තේ 2023.10.28 දින වේ. මෙම කාල වකවානුව තුළ විදුලි සැපයුම සාමාන්‍ය තත්වයට පත්වී තිබු බැවින් විදුලි ජනක යන්ත්‍රය ක්‍රියා කරවීම අවශ්‍ය නොවු බැවින් ඉන්ධන ටැංකිය සවිකිරීමේ ප්‍රමාදය ඒ සඳහා බලපා නැත. | භාණ්ඩ මිලදී ගැනීමේදී අවශ්‍යතාවය නිසි ලෙස පූර්වයෙන් නිගමනය කලයුතු වීම. |

| | | |
|---|---|---|
| (iii)2022 වර්ෂයේ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් දීර්ස වශයෙන් විදුලිය විසන්ධි වීමේදී කොමිෂන් සභාවේ දත්ත මධ්‍යස්ථානයට අඛණ්ඩව විදුලිය ලබාදීමේ අවශ්‍යතාවය සඳහා අමතර විදුලි ජනන යන්ත්‍රය හා අතිරේක ඉන්ධන ටැංකිය මිලදී ගෙන තිබුණද එම ප්‍රසම්පාදනයේ ප්‍රමාදය නිසා 2023 දෙසැම්බර් වන විටත් විදුලි ජනන යන්ත්‍රය හා අතිරේක ඉන්ධන ටැංකිය ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොතිබුණි. | 2022 වර්ෂයේ හා 2023 වර්ෂයේ මුල් භාගයේ පැවති විදුලි කප්පාදුව හා ඉන්ධන හිඟතාවය මත දත්ත මධ්‍යස්ථානයට අඛණ්ඩව විදුලි සැපයුමක් ලබාදීමේ අරමුණින් මෙම විදුලි ජනක යන්ත්‍ර හා ඉන්ධන ටැංකිය සවිකිරීමට ක්‍රියාකරන ලදී. අදාළ සවිකිරීමෙන් අනතුරුව එසේ විදුලි කප්පාදුවක් නොමැති නිසා එය භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී නැත. එහෙත් ඉදිරියේ දී නැවත එවැනි තත්ත්වයක් මතු වුවහොත් මෙම විදුලිජනක යන්ත්‍රය භාවිතා කළයුතු වේ. | ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුල ඉටුකර ගත යුතු වීම. |
| **(ඇ) කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා විදුලි ජනන යන්ත්‍රයක් සවි කිරීමේ ප්‍රසම්පාදනය** | | |
| (i) කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා විදුලි ජනන යන්ත්‍රයක් 2020 දෙසැම්බර් 30 වනදින රු.1,720,000 කට මිලදීගෙන තිබුණු අතර යන්ත්‍රය ආයතන පරිශ්‍රයේ සවි කර තිබුණේ 2023 ජනවාරි 05 දින එනම් යන්ත්‍රය මිලදීගෙන වසර 02 කට පසුව විය. | කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීමේදී සිදුවී ඇති ප්‍රායෝගික ගැටළු හා ප්‍රමාදවීම් මත මෙම විදුලිජනක යන්ත්‍රය සවි කිරීම ප්‍රමාදවූ අතර එය කොමිෂන් සභාවේ පාලනයෙන් තොරවූ කරුණක් බව සඳහන් කරමි. | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුල ඉටුකර ගත යුතු වීම. |
| (ii) යන්ත්‍රය මිලදී ගන්නා අවස්ථාවේදී අදාල සැපයුම්කරු විසින් සවිකිරීමේ ගාස්තු ලෙස රු.275,000 ක මිලක් ඉදිරිපත් කර තිබුණි.පසුව 2022 මැයි 05 වන දින ඉදිරිපත් කර තිබුණු මිල රු.469,714 ක් වීම නිසා රු.194,714 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි. | අපගේ පාලනයෙන් තොර වූ කාරණා නිසා මාස 15 කට පමණ පසුව විදුලිජනක යන්ත්‍රය සවිකිරීමේ කාර්යය ඉටුකිරීමට සිදුවීම, එම දිනවල (2022 මැයි ආසන්න කාලයේ) රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ භාණ්ඩ හා සේවා මිල අධික ලෙස ඉහළ යාම, ඉන්ධන හිඟතාවය මත විදුලි බලය දීර්ඝ කාලයක් විසන්ධි කිරීම මත මෙම විදුලි ජනක යන්ත්‍රය කඩිනමින් සවිකර ගැනීමේ දැඩි | ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුල ඉටුකර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| | අවශ්‍යතාවයක් මත වීම යන කරුණු සලකා ඉහත සංශෝධික ඇස්තමේන්තුව අනුමත කර කාර්යය පවරන ලදී. එය අත්‍යවශ්‍ය කාර්යයක් වූ බැවින් එම ඇස්තමේන්තුව අනුමත කර ඇත. රටෙහි පැවති අයහපත් ආර්ථික තත්ත්වය හා භාණ්ඩ මිල සීඝ්‍රයෙන් ඉහල යාම යන කරුණු මත ආයතනය විසින් කල ඉල්ලීම සලකා එම අමතර ඇස්තමේන්තු සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදී ඇත. | |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පලාත් පාලන ආයතනවල ධූර කාලය 2023 මාර්තු 19 වන දිනෙන් අවසන් වූ අතර අදාල නාමයෝජනා දැන්වීම 2023 ජනවාරි 04 වන දින ප්‍රදර්ශන කර තිබුණි. ඡන්ද විමසීම පැවැත්වෙන දිනයන් හා ඒවා අවලංගුවීම් වලට අදාල ගැසට්පත්‍ර 03 ක් නිකුත් කර තිබුණි. නියමිත දිනයට මැතිවරණය පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාවට නොහැකි වුවද, මැතිවරණ වියදම් ලෙස රු.655,096,226 ක් වැයකර තිබුණු අතර 2023 සැප්තැම්බර් 30 දිනට රු.15,933,472 ක් තවදුරටත් ගෙවිය යුතුවියදම් ලෙස පැවතුණි.මැතිවරණ වියදමින් සියයට 15 ක් අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහාද සියයට 23 ක් ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමටද, සියයට 7 ක් ඉන්ධන සඳහාද, සියයට 31 ක් මුද්‍රණ කටයුතු සඳහාද, සියයට 7 ක් සංග්‍රහ කටයුතු සඳහාද, සියයට 4 ක් පොලිස් දෙපාර්තමේන්තුවේ වියදම් වෙනුවෙන්ද හා සියයට 13 ක් අනෙකුත් වියදම් සඳහාද වැය කර තිබුණි. | පළාත් පාලන ආයතනවල ධූරකාලය 2023 මාර්තු 19 වන දිනෙන් අවසන් වූ අතර අදාල නාමයෝජනා දැන්වීම 2023 ජනවාරි 04 දින ප්‍රකාශ කර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ කටයුතු ආරම්භ කරන ලදි. මැතිවරණ කොමිෂන් සභාවේ අරමුණ ඡන්ද විමසීම නියමිත පරිදි පවත්වා 2023 මාර්තු 19 දිනට ප්‍රථම සභිකයින් තෝරා පත්කර ගැනීම අවසන් කිරීමයි. ඒ අනුව ඡන්ද විමසීමට අදාල කටයුතු කළ අතර එහිදී විමසුමේ සඳහන් වියදම් දැරීමට සිදුවිය. | මැතිවරණයක් පැවැත්වීම සඳහා සපුරාගත යුතු මූල්‍ය හා වෙනත් අවශ්‍යතා පූර්න නොකර කටයුතු කිරීමෙන් රාජ්‍ය මූල්‍ය නාස්තියක් වන හෙයින් එවැනි අනාගත සිදුවීම් ඇතිවීම වලක්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා රු.12,556,695 ක් වැය කර තිබුණු අතර ඉන් වාහන අළුත්වැඩියාව සඳහා දරා තිබූ මුදල රු.5,669,850 කි. ඉන් කොමිෂන් සභාවට අයත් නොවන වෙනත් ආයතන සතු වාහන 69 ක සේවා කිරීම් හා අළුත්වැඩියා කිරීම් සඳහා රු.2,312,644 ක් ගෙවා තිබුණි. | මැතිවරණ කොමිෂන් සභාවේ අරමුණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නියමිත පරිදි පැවැත්වීම වූ බැවින් ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා විමසුමේ සඳහන් වියදම් දැරීමට සිදුවිය. ඡන්ද විමසීමේ කටයුතු සඳහා කොමිෂන් සභාවේ වාහන ප්‍රමාණවත් නොවූ බැවින් වෙනත් ආයතන සතු වාහන ලබා ගැනීමට සිදු වූ අතර එම වාහන සේවා කිරීම හා අලුත්වැඩියා කිරීමටද සිදුවිය. | රාජ්‍ය ආයතන වෙතින් වාහන ලබාගන්නා විට කාර්මික පරීක්ෂාවකට ලක්කිරීම.<br>වාහන අලුත්වැඩියා වියදම් නැවත පියවා ගැනීමේ ක්‍රමයක් සකස්කර ගැනීම. |
| (ඇ) | පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ලැප්ටොප් හා මුද්‍රණ යන්ත්‍ර කුලී පදනම මත ලබාගෙන තිබූ අතර ඒ සඳහා රු.5,289,855 ක් ගෙවා තිබුණි.මැතිවරණ නොපැවැත්වීම හේතුවෙන් එම යන්ත්‍ර ආපසු අදාල ආයතන වෙත භාරදී තිබුණද මෙම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සිදුකිරීම සඳමා මැතිවරණ කොමිෂන් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ පරිදි නිකුත් වූ ගැසට් නිසේදන හා චක්‍රලේඛ පරිදි ඡන්ද විමසීම පැවැත්වීමට අදාල මූලික සංවිධාන කටයුතු සිදු කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කල අතර ප්‍රධාන කාර්යාලය ඇතුලු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර හා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කරන ලදි. කෙටිකාලය තුල ඉටුකල යුතුව තිබූ විශාල රාජකාරි කටයුතු පහසු කිරීම සඳහා කාර්යාලවලට අවශ්‍යතාවය සරිලන පරිදි ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් යන්ත්‍ර උපකරණ කුලී පදනම මත ලබා ලැනීමට සිදුවිණි. 2023.03.09 දින ඡන්ද විමසීම පැවැත්වීමට ප්‍රකාශයට පත්කර තිබීම මත මෙම කාර්යයන් සිදුකර ඇති බැවින් මෙම වියදම දැරීමට සිදුවිය. | රාජ්‍ය ආයතන තුලින් අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2023 සැප්තැම්බර් 14 දිනැති හා F/18/2023 අංක දරන තොරතුරු ලැබීමේ ලිපිය අනුව මෙම මැතිවරණය සඳහා 2023 ජූලි 31 දිනට ලිපි ද්‍රව්‍ය වියදම රු.162,911,483 ක් වී තිබුණි. ඉන් රු.29,009,706 ක් Toner, Ink හා Drum සඳහා වියදම් කර තිබුණු අතර ලිපි කවර සඳහා රු.92,472,972 ක් වැය කර තිබුණි. මෙම ලිපි කවර නැවත භාවිතා කළ නොහැකිවීම හේතුවෙන් එම වියදම නිශ්කාර්ය වී තිබුණි. | අදාල ලිපිකවර නැවත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | රාජ්‍ය මූල්‍ය ආර්ථිකවද ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කිරීම. |
| (ඉ) කොළඹ දිස්ත්‍රික් හා කොළඹ නාගරික මැතිවරණ කාර්යාල විසින් මැතිවරණ රාජකාරි කටයුතු සඳහා වරින් වර ආයතන වෙතින් වාහන කැඳවීම් සිදු කර තිබුණු අතර මැතිවරණ කටයුතු සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වාහන ප්‍රමාණය පිළිබඳව පූර්ව සැලසුමක් නොතිබුණි. තවද කොළඹ නාගරික හා කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් මූලික සංවිධාන කටයුතු සඳහා සකස් කරන ලද වාහන අවශ්‍යතා සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොකෙරුනි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරමි. ඉදිරි ඡන්ද විමසීම්වලදී වාහන අවශ්‍යතා සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | මැතිවරණ කටයුතු සඳහා අවශ්‍ය වාහන ප්‍රමාණය පිළිබඳව පූර්ව සැලසුමක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වීම. |

### 3.3 සැලැසුම් කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අනුමත කළයුතු වුවත් කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර | 2023 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී සමහර අංශ වෙතින් නියමිත දිනයන්වලදී තොරතුරු ලබා නොදීමත්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කිරීමේ මූලික කටයුතු ඒ වන විටත් ආරම්භ කර තිබූ බැවින් නියමිත දිනට පෙර අනුමත | ක්‍රියාකාරී සැලැස්ම හා අදාල සංශෝධන නියමිත කාලවකවානු වලදී අනුමත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණේ 2023 පෙබරවාරි 07 දිනය.ඉන්පසු එම සැලැස්ම සිව්වරක් සංශෝධනය කර තිබුණු අතර සංශෝධිත සැලසුම් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කිරීමට ප්‍රායෝගික ගැටළු පැන නැඟිනි. එසේම කාර්තුවට අදාල සංශෝධිත සැලැස්මේ ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේදී මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව යොමු කර ඇති බැවින් ඒ සඳහා නිසි අධිකාරි බලය ලැබී ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි. | |
| (ආ) | 2023 ක්‍රියාකාරී සැලැස්මෙහි නීති අංශය විසින් ඉටුකිරීම සඳහා සැලසුම්කර තිබුණු කාර්යයන් 9 ක් පලාත් පාලන මැතිවරණය නොපැවැත්වීම හේතුවෙන් ඉටුකිරීමට නොහැකි වී තිබුණු අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය කාර්යයන් 4ක් ඉටුකර නොතිබුණි. තවද පාලන අංශය විසින් වර්ෂය තුළ ක්‍රියාත්මක කලයුතු කාර්යයන් නිවැරදිව හඳුනා නොගෙන වර්ෂය තුළ සිදුකර තිබූ කාර්යයන් ඇතුළත් කර සැලැස්ම වරින්වර සංශෝධනය කර තිබුණි. | නීති අංශය විසින් ඉටුකිරීම සඳහා සැලසුම්කර තිබුණු කාර්යයන් 9 න් කාර්යයන් 06 ක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නොපැවැත්වීම මත එම ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට නොහැකි වු අතර කාර්යයන් 3 ක් කොමිෂන් සභාවේ පරිපාලනයට පරිබාහිරව පැනනැගුණ විවිධ මූල්‍ය හා භෞතික ගැටළු මත ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් එම ක්‍රියාකාරකම් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට තීරණය කරන ලදි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය කාර්යයන් 4 2024 වර්ෂයේ සිදු කිරීමට නියමිතය. | ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම්ගත කාර්යයන් නිවැරදිව හඳුනාගත යුතු අතර සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ජාතික මැතිවරණ අංශයට අදාලක්‍රියාකාරි සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම සඳහා කාර්යසාධන දර්ශක (KPI)හඳුනාගෙන නොතිබුණි. | එක් එක් ක්‍රියාකාරකම්වලට අදාල ප්‍රධාන කාර්යය සාධන දර්ශකය (KPI) සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්ම අනුව හඳුනාගෙන ඇති බැවින් එය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම සඳහා කාර්යසාධන දර්ශක (KPI) හඳුනාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිසි පරීක්ෂාවකින් තොරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම නිසා පසුව සිදුකර තිබූ සංශෝධනයන් වලදී ක්‍රියාකාරකම් ගණනෙහි විශාල විචලනයන් වී තිබුණි.නැවත එම ක්‍රියාකාරකම් වෙනත් අංශ වෙත මාරු කර තිබුණු අතරඇතැම් කාර්යයන් 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. | මේ පිළිබඳව සියලු අංශ මේ වන විට දැනුම්වත් කර ඇති අතර, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී එකී ගැටළු අවමවන පරිදි කටයුතු කර ඇත. 2023 වර්ෂයේ පැනනැගුණ විවිධ මූල්‍ය හා භෞතික ගැටළු මත අංශවලට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර, 2022 – 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම අනුව ඉටුකර ගැනීමට නොහැකි වූ ක්‍රියාකාරකම් 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. | නිසි පරීක්ෂාවකින් යුතුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |

## 3.4 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොමිෂන් සභාවට අයත් වාහන 05 ක් සමාලෝචිත වර්ෂයේ ඉතා අඩු වශයෙන් ධාවනය කර තිබුණු අතර බොහෝ අවස්ථා වලදී ඒවා ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණි. 2022 ඔක්තෝබර් මාසයේදී ඉන් එක් වාහනයක ටයර් 05 ක් මාරු කර තිබුණු අතර ටයර් මාරු කිරීමෙන් පසු 2023 දෙසැම්බර් 31 දින දක්වා එම වාහනය ධාවනය කර තිබුණේ කිලෝ මීටර් 19 ක් පමණි. | එහි දක්වා ඇති පරිදි එක් වාහනයක් 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී ටයර් 5 ක් මාරු කර තිබුණු අතර 2023.12.31 දක්වා එම වාහනධාවනය කර තිබුණේ කිලෝමීටර 19ක් පමණි. මෙම රථය අලුත්වැඩියා කටයුතු සඳහා 2018 අගෝස්තු මස නියෝජිත ආයතනය වෙත යොමු කර ඇතත් අලුත්වැඩියාව සඳහා අමතර කොටස් නොමැති වීම හේතුවෙන් මාස තුනක පමණ කාලයකට පසු රථය නැවත කාර්යාලයට ගෙනවිත් ගාල්කර තිබුණි. පසුව රජයේ ආයතන වෙත නව වාහන මිලට ගැනීම නවතාලමින් රජය විසින් නිකුත් කළ විධි විධාන නිසාවෙන් පැරණි වාහන නැවත අලුත්වැඩියා කටයුතු සඳහා යොමු විය. ඒ අනුව මෙම රථයේ ද අලුත්වැඩියා කිහිපයක් යෙදී තිබුණු අතර පවතින මුදල් ප්‍රතිපාදන මත වරින් වර එම අලුත්වැඩියා කටයුතු සිදුකරවා ගන්නා ලදි. අලුත්වැඩියා කටයුතුවලින් පසු සාමාන්‍ය රාජකාරි | වාහන උපයෝජනය හා නඩත්තුව සම්බන්ධව ආර්ථික හා ඵලදායීව තීරණ ගැනීම. |

| | | |
|---|---|---|
| | සඳහා යොදා ගත් අතර, එසේ රාජකාරි කටයුත්තක් සඳහා යාමේ දී අතර මහදී ටයරයක් පුපුරා ගොස් ඇත. ඒ වනවිට ටයර් යොදා වසර පහකට වැඩි කාලයක් ගතවී තිබීම හා රථය ධාවනය නොකර තිබූ බැවින් ඉතිරි ටයරය ද ධාවනයට නුසුදුසු බව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව රථයට නව ටයර් පහක් යොදා ඇත.මෙම වාහනය 2024 වර්ෂයේ සිට රාජකාරි කටයුතු සඳහා යොදවා ගන්නා බව දන්වමි. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08ක්, තෘතියිය මට්ටමේ පුරප්පාඩු 07 ක්, ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 46 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 32 ක් පැවති අතරමෙම වාර්තාවේ දින වන විටත් කොමිෂන් සභාව විසින් මෙම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා නිලධාරින් ලබාදෙන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇති අතර කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කරයි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |